DOI : 10.31357/fhssmph.2013.00726

# ගම්පොළ යුගයේ ආරම්භයේ සිට කෝට්ටේ යුගයේ අවසානය තෙක් රාජ්‍ය තන්ත්‍රය හා බැඳි සිටි ප්‍රභූ රාජ පෙළපත් පිළිබඳ විමර්ශනයක්

බමුණු අච්චිගේ කුමුදුනි සෞම්‍යා ආරියරත්න

04 JUL 2013

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනපති පරික්ෂණය සඳහා ඉතිහාසය විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධයයි.

මේ ශාස්ත්‍රීය නිබන්ධය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එස්. ඩී. එන්. ධර්මරත්න මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත් මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

..........Sammya..........

(බී. ඒ. කේ එස් ආරියරත්න)

පරික්ෂක මණ්ඩලය විසින් නිර්දේශිත සියලුම නිවැරදි කිරීම්, සංශෝධන සහ එකතු කිරීම් උපාධි අපේක්ෂිකාව/ අපේක්ෂකයා විසින් අවසාන නිබන්ධය සඳහා ඇතුලත් කර ඇති බව මෙයින් සහතික කරමු

.....................................................................

(මහාචාර්ය පී.බී. මන්ඩාවල)

( ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ අංශාධිපති)

අධ්‍යයනාංශ ප්‍රධාන
ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල
නුගේගොඩ
ශ්‍රී ලංකා

පරීක්ෂක මණ්ඩලය විසින් නිර්දේශිත සියලුම නිවැරදි කිරීම්, සංශෝධන සහ එකතු කිරීම් උපාධි අපේක්ෂිකාව/ අපේක්ෂකයා විසින් අවසාන නිබන්ධය සඳහා ඇතුලත් කර ඇති බව මෙයින් සහතික කරමු

2013-07-13

.................................................

(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එස්. ඩී. එන්. ධර්මරත්න)
(උපදේශකතුමා)

## පටුන

1 වන පරිච්ඡේදය

හැඳින්වීම සහ මූලාශ්‍ර පරිශීලනය 1–42

1.1 හැඳින්වීම 1–6

1.2 මූලාශ්‍ර 7–42

1.2.1 සාහිත්‍ය මූලාශ්‍ර 7–28

1.2.1.1 සන්දේශ සාහිත්‍යය 20–26

1.2.1.1 අනිකුත් සාහිත්‍ය මූලාශ්‍ර 27–28

1.2.2 පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර 29–39

1.2.2.1 ගම්පොළ යුගයේ සෙල්ලිපි 29–36

1.2.2.2 කෝට්ටේ යුගයේ වැදගත් සෙල්ලිපි 36–39

1.2.3. විදේශීය මූලාශ්‍ර 39–42

1.2.3.1 ඉබන් බතූතා 40

1.2.3.2 චීන මූලාශ්‍ර 40–41

1.2.3.3 පෘතුගීසි වාර්තා 41–42

2 වන පරිච්ඡේදය

ගම්පොළ රාජධානිය බිහිවීමට බලපෑ ඓතිහාසික හා සමකාලීන දේශපාලනික, ආර්ථික සමාජ පසුබිම. 43–57

2.1 ගම්පොළ ඓතිහාසික පසුබිම 43–49

2.2 ගම්පොළ නගරය මුල් කරගෙන රාජධානියක් බිහිවීමට බලපෑ සමකාලීන දේශපාලනික පසුබිම. 47–52

2.3. ගම්පොළ නගරය කරා රාජධානිය ගෙන යාමට බලපෑ සමකාලීන ආර්ථික පසුබිම. 52–55

2.4 ගම්පොළ නගරය කරා රාජධානිය ගෙන යාමට බලපෑ සමකාලීන සමාජ පසුබිම. 55–57

3 වන පරිච්ඡේදය

ගම්පොළ හා කෝට්ටේ යුගයන්හිදී මෙරට දේශපාලන ප්‍රවාහයට එක් වූ නව පෙළපත්වල ආරම්භය හා විකාශනය 58–109

3.1 ගම්පොළ රජ පෙළපත හෙවත් සවුළු පෙළපත. 61–77

3.1.1 පස් වන විජයබාහුගෙන් ආරම්භ වූ සවුළු පෙළපතේ සාමාජිකයෝ 68–77

3.1.1.1 සතර වන බුවනෙකබාහු හා පස් වන පරාක්‍රමබාහු

3.1.1.2 තුන් වන වික්‍රමබාහු

3.1.1.4. පස් වන බුවනෙකබාහු රජු

3.1.1.4. වීරබාහු නම් ඈපාණෝ

3.2 සේනාලංකාධිකාර පෙළපත 77–85

3.2.1 සේනාලංකාධිකාරතුමාගෙන් ආරම්භවූ පරපුර 84–85

3.3. අලකේශ්වර පෙළපත 85–109

3.3.1. අලකේශ්වර පෙළපතේ මූලාරම්භය 85–94

3.3.2 අලකේශ්වර පෙළපතේ සාමාජිකයෝ 95–109

3.3.3.1 නිශ්ශංක අලගක්කෝණාර 100–109

4 වන පරිච්ඡේදය

ගම්පොළ හා කෝට්ටේ යුගයන්හිදී මෙරට ඇති වූ දේශපාලන වෙනස්වීම්වලට මෙම පෙළපත්වල දායකත්වය. 110-204

4.1 ගම්පොළ රජවරු 110-139

4.1.1 පස් වන විජයබාහු රජු 110-111

4.1.2 සතර වන බුවනෙකබාහු රජු 112-121

4.1.3 පස් වන පරාක්‍රමබාහු රජු 121-126

4.1.4 තුන් වන වික්‍රමබාහු රජු 126-131

4.1.5 පස් වන බුවනෙකබාහු රජු 131-134

4.1.6 වීරබාහු ඈපා 134-136

4.1.7 වීරබාහු ඈපාට පසු බලයට පත් වූවෝ 136-137

4.2 සේනාලංකාධිකාර හා අලගක්කෝණාර පෙළපත් අතර බල අරගල 137-145

4.3 කෝට්ටේ රජවරු 145-204

4.3.1 සය වන පරාක්‍රමබාහු රජු 145-175

4.3.2 දෙවැනි ජයබාහු රජු 175- 181

4.3.3 සය වන බුවනෙකබාහු රජු 181-188

4.3.4 සත්වන පණ්ඩිත පරාක්‍රමබාහු රජු 188-189

4.3.5 අට වන වීරපරාක්‍රමබාහු රජු 189-199

4.3.6 හය වන විජයබාහු රජු 199-204

5 වන පරිච්ඡේදය

කිරවැල්ලේ පෙළපත 205-257

5.1 කිරවැල්ල පෙළපතට අයත් වැදගත් රජවරු. 218-227

5.1.1 දෙවැනි ජයබාහු රජු

5.1.2. සත් වන බුවනෙකබාහු රජු

5.1.3 ධර්මපාල රජු

5.1.4 පරරාජසිංහ රජු

5.1.5 මායාදුන්නේ රජු

5.1.6 1 වන රාජසිංහ රජු

5.2 කිරවැල්ලේ පරපුරේ සාමාජිකයින්ගේ ක්‍රියාකාරකම් 227-257

මෙරට දේශපාලන ඉතිහාසය වෙනස් කිරීමට බලපෑ අයුරු.

5.2.1 විජයබා කොල්ලයෙන් පසු රට බෙදියාම 229-231

5.2.2 සත් වන බුවනෙකබාහු රජු හා මායාදුන්නේ

අතර ඇති වු සටන් නිසා ඇති වු බලපෑම් 231-239

5.2.3 සත් වන බුවනෙකබාහු හා පෘතුගිසීන් අතර පැවති සම්බන්ධතා 239-241

5.24 මායාදුන්නේ හා විදිය බණ්ඩාර අතර ඇති වු සටන් 241-243

5.2.5 මායාදුන්නේ හා පෘතුගිසීන් අතර පැවති සම්බන්ධතා 243-245

5.2.6 මායාදුන්නේ හා රාජසිංහ කුමරු එක්ව පෘතුගිසීන්ට විරුද්ධව කළ සටන් 245-248

5.2.7 සීතාවක රාජසිංහ හා පෘතුගිසීන් අතර පැවති සටන් 248-250

5.2.8 කෝට්ටේ ධර්මපාල රජු හා පෘතුගිසීන් අතර පැවති 250-253

සම්බන්ධතා

5.2.9 මායාදුන්නේ හා උඩරට සබඳතා 253-254

5.2.10 රාජසිංහ හා උඩරට සබඳතා 255-257

- සමාලෝචනය හා නිගමනය 258-261
- උපග්‍රන්ථය 262-267
- ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 267-275

## ස්තුතිය


ගම්පොළ යුගයේ ආරම්භයේ සිට කෝට්ටේ යුගයේ අවසානය දක්වා රාජ්‍ය තන්ත්‍රය හා බැඳී සිටි ප්‍රභූරාජ පෙළපත් පිළිබඳ විමර්ශනයක් නමින් දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන මෙම ස්වාධීන නිබන්ධය සැකසීමේදී අවශ්‍ය මාර්ගෝපදේශකත්වය ලබා දුන් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එස්. ඩී. එන්. ධර්මරත්න මහතාට මාගේ කෘතඥතාව ප්‍රථමයෙන් පුද කරමි. සමස්ත අධ්‍යයනය තුළ පැනනැගුණු ගැටළු නිරාකරණය කරදෙමින් මා යායුතු නිවැරදි මාර්ගය පෙන්වා දුන් ඒ මහතා මා විසින් සකසා දුන් නිබන්ධනය පරීක්‍ෂා කරමින් ඒවායේ වැරදි නිවැරදි කර ගැනීමට අවශ්‍ය උපදේශකත්වයද නොමදව ලබා දුන්නේය. මෙම අධ්‍යයනයේදී පැන නැගුණු ගැටළු රැසකට විසඳුම් ලබාදෙමින් නව මාවතක් ඔස්සේ මාගේ නිබන්ධය ගෙන යෑමට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය ලබා දුන් අභාවප්‍රාප්ත මහාචාර්ය මැන්දිස් රෝහණදීර කෘතඥපූර්වකව සිහිපත් කරමි. අනතුරුව නන් අයුරින් සහයෝගය ලබා දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ අංශාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පද්මසිරි කන්නංගර මහතා ප්‍රමුඛ සියලුම ආචාර්යවරුන් සිහිපත් කරන්නේ හදපිරි ගෞරවයෙනි.

එසේම මෙම අධ්‍යයනයේදී අවශ්‍ය කරුණු ලබා ගැනීමට සහයෝගය දැක්වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයත්, ජාතික කෞතුකාගාරයේ අධ්‍යක්‍ෂකතුමා ඇතුළු කාර්ය මණ්ඩලයත්, ජාතික ප්‍රලේඛන මධ්‍යස්ථානාධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයත් විශේෂයෙන් සිහිපත් කරමි. මීට අමතරව අවශ්‍ය කරුණු ලබා දුන් ලංකාතිලක විහාරය, ගඩලාදෙණි විහාරය, කෑරගල විහාරය හා කිත්සිරිමෙවන් කැලණි යන විහාරයන්හි විහාරාධිපති ස්වාමීන් වහන්සේලා සියලු දෙනාද ගෞරවයෙන් සිහිපත් කරමි.

අවසාන වශයෙන් මෙම අධ්‍යයනයේදී තම වැඩ කටයුතු පසෙක ලා සෝදුපත් බලමින් හා පරිගණක ගත කරමින් අනුපමේය සේවයක් කළ නැගණිය රුවන්තිකා හා දෙමාපියන්ටද සහෝදරයින් දෙදෙනාට හා සැමියා වූ බන්දුල සමරසේකරටද මාගේ කෘතඥ පූර්වක ස්තුතිය හිමිවේ.

# ගම්පොළ යුගයේ ආරම්භයේ සිට කෝට්ටේ යුගයේ අවසානය තෙක් රාජ්‍ය තන්ත්‍රය හා බැඳී සිටි ප්‍රභූ රාජ පෙළපත් පිළිබඳ විමර්ශනයක්

බමුණු අච්චිගේ කුමුදුනි සෞම්‍යා ආරියරත්න

## නිබන්ධ සාරාංශය

ගම්පොළ යුගයේ ආරම්භයේ සිට කෝට්ටේ යුගයේ යුගයේදී අවසානය තෙක් රාජ්‍ය තන්ත්‍රය හා බැඳී සිටි ප්‍රභූ පෙළපත් පිළිබඳ විමර්ශනය කිරීමට සිදු කළ මෙම නිබන්ධනයේ ප්‍රධාන අරමුණ වුයේ ප්‍රස්තුත කාලයේ වාසය කළ ප්‍රභූ පෙළපත්වල ආරම්භය විකාශනය හා ඔවුන්ගෙන් මෙරටට දේශපාලන ක්ෂේත්‍රයට වූ බලපෑම අධ්‍යයනය කිරීමය. එහිදී විවිධ විද්වතුන් විසින් ප්‍රස්තුතයට අදාළව සිදු කර ඇති පර්යේෂණ අධ්‍යයනය කරමින් ඒවායේ දක්වා ඇති මතවාදවල නිවරද්‍යතාව විමර්ශනයට ලක් කෙරිණි. විශේෂයෙන් මෙම පර්යේෂකයන් මෙම ප්‍රභූ පෙළපත්වල සාමාජිකයන්ගේ දේශපාලන කාර්යය සාකච්ඡා කරන ලද මුත් ඔවුන්ගේ පෙළපත්වල ආරම්භය හා විකාශනය පිළිබඳ එතරම් අවධානයක් යොමු කර නොතිබීම මා මෙම පර්යේෂණය සඳහා පෙළඹවු හේතුව විය. විශේෂයෙන් කිරවැල්ලේ පෙළපත ගැන විධිමත් පර්යේෂණයක් මෙතෙක් සිදු කර නොමැති වීමද ඒ සඳහා බලපෑවේය.

මෙම පර්යේෂණයේදි අනුගමනය කරන ලද ක්‍රමවේදය වුයේ ප්‍රාථමික මුලාශ්‍රයන් ඔස්සේ මෙම පෙළපත්වල විකාශනය පරීක්ෂාවට ලක් කිරීමයි. එහිදි පුස්තකාල අධ්‍යයනයක මෙන්ම ක්ෂේත්‍ර අධ්‍යයනයක නිරතවෙමින් ප්‍රාථමික මුලාශ්‍රයන්ගේ දැක්වෙන තොරතුරු ඇසුරින් ප්‍රස්තුතයට අදාළ තොරතුරු ග්‍රහණය කර ගතිමි.

ඒ අනුව මෙම අධ්‍යයනය තුළින් ගම්පොළ සවුළු පෙළපත, සේනාලංකාධිකාර පෙළපත, අලගක්කෝණාර පෙළපත හා කිරවැල්ලේ පෙළපත යන පෙළපත්වල ආරම්භය හා විකාශනය පිළිබඳව තොරතුරු රැසක් අනාවරණය කර

ගැනිමට හැකි විය. සවුළු පෙළපත අනුරාධපුර යුගයේ ආරම්භයේ සිට මායා රටේ වාසය කළ ප්‍රභූ පෙළපතක් බව අනාවරණය වූ අතර අලගක්කෝණාරවරුන් පොළොන්නරුව රාජධානිය ආරම්භක යුගයේදී මෙරටට පැමිණ බවත් පිළිගත හැකිවිය. සේනාලංකාධිකාර පෙළපත මෙහෙණවර වංශයට අයත් බවත් කිරවැල්ලේ පෙළපත හේමමාලා කුමරිය හා දන්ත කුමරුන්ගෙන් ආරම්භ වූ බවත් මෙම අධ්‍යයනයේදී පෙන්වා දිමට උත්සාහ ගතිමි. මෙසේ පෙළපත්වල ආරම්භය හා විකාශනය පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඔවුන්ගෙන් මෙරටට සිදුවූ බලපෑම් අධ්‍යයනය කොට ඇත.

ඒ අනුව මෙම අධ්‍යයනය ඇසුරෙන් ලබා ගත් පොදු ප්‍රතිඵලය වූයේ අනුරාධපුර යුගයේ ආරම්භයේ සිට මායා රටේ වාසය කළ මෙම ප්‍රභූ පෙළපත් තම බල ප්‍රදේශ කරා රාජධානි සංක්‍රමණය වීම අවස්ථාව කරගෙන මෙරට පාලන බලය ලබා ගැනිමට උත්සාහ කිරීම නිසා මෙරට දේශපාලන ගමන් මඟ වෙනස් වූ බවයි.

## කෙටි යෙදුම්

| | |
|---|---|
| අ.ත.ප | – අස්ගිරි තල්පත |
| අල.යු. | – අලකේශ්වර යුද්ධය |
| එළු. | – එළු අත්තනගලු වංසය, |
| කෝකිල. | – කෝකිල සංදේශ |
| ගිරා. | – ගිරා සංදේශ |
| තිසර. | – තිසර සන්දේශය, |
| නි.ස. | – නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය |
| පරෙවි. | – පරෙවි සංදේශ සංදේශය කාව්‍ය වර්ණනාව |
| පාරමි. | – පාරමි මහා සතකය |
| පැ.සි. | – පැරකුම්බා සිරිත |
| පූජා. | – පූජාවලිය |
| මයුර. | – මයුර සංදේශ විවරණය |
| ම.ව. | – මහාවංසය |
| රාජ. | – රාජ රත්නාකරය |
| රා.ව. | – රාජාවලිය |
| ස.ර.ක. | – සද්ධර්මරත්නාකරය |
| සද්. අලං. | – සද්ධර්මාලංකාරය, |
| සැළ. | – සැළලිහිණි සංදේශය, |
| ල.වි.ල.ඉ | – ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, |
| හංස | – හංස සංදේශය |
| **C.A.L.R** | **- Ceylon Antiquary and Literary Register,** |

| | |
|---|---|
| **Couto** | **-The History of Ceylon from earliest times to 1600 A.D.** JRAS(CB)., Vol.XX No. 60., 1908 |
| **EZ** | **-Epigraphia Zeylanica** |
| **J RAS (CB)** | **- Journal of the Ceylon Branch of the Royal Aslatic Society** |
| **RKD** | **- Report on The Kegalla District of the provincle Sabaragamuwa** |
| **UCR** | - University of Ceylon Review, |
| **Uueyroz** | **- The temporal and Spiritual Conquest of Ceylon** |

# 1 වන පරිච්ඡේදය

# හැඳින්වීම සහ මූලාශ්‍ර පරිශීලනය

## 1.1 හැඳින්වීම

ගම්පොළ යුගයේ ආරම්භයේ සිට කෝට්ටේ යුගය අවසානය තෙක් රාජ්‍ය තන්ත්‍රය හා බැඳී සිටි ප්‍රභූ රාජ පෙළපත් පිළිබඳ සිදු කළ මෙම අධ්‍යයනයේදී මූලික අරමුණ වූයේ එකී පෙළපත්වල ආරම්භය, විකාශනය හා මෙරට දේශපාලන ක්ෂේත්‍රයට සිදු වූ බලපෑම් අධ්‍යයනය කිරීමය. කිරවැල්ලේ පෙළපත ප්‍රධාන කර ගනිමින් මෙම යුගයේ බිහි වූ නව පෙළපත් වල ක්‍රියාකාරකම් මෙරට දේශපාලන, සමාජ, ආර්ථික අංශයන්ට සිදු කළ බලපෑම අධ්‍යයනය කිරීම මෙම නිබන්ධයෙහි තවත් අරමුණක් විය.

ප්‍රස්තුත කාල පරාසය ගැන විවිධ අංශ ඔස්සේ විද්වත්තුන් පර්යේෂණ කර ඇති නමුත් මෙම පෙළපත් පිළිබඳ පුළුල් අධ්‍යයනයක් සිදුකර නොමැතිවීම ඒ සඳහා මා පෙළඹවූ සාධකය විය. ගම්පොළ හා කෝට්ටේ යුගවල දේශපාලනය ගැන පර්යේෂණ කළ පර්යේෂකයින් සවුළු පෙළපත හා අලගක්කෝණාර පෙළපත පිළිබඳ තම අදහස් හා මතවාද ඉදිරිපත් කර තිබේ.

විශේෂයෙන් **"ලංකා ඉතිහාසයේ ගම්පොළ යුගය"** නමින් එච්. ඩබ්ලිව්. කොඩ්රින්ටන් රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛාවේ සඟරාවේ තිස් දෙවැනි කලාපයට ලිපියක් ලියමින් ගම්පොළ යුගයේ ඉතිහාසය ගැන කරුණු ගොනුකර ඇත[1]. එම ලිපියේ ගම්පොළ සවුළු පෙළපත, අලගක්කෝණාර පෙළපත ආදි මේ යුගයේ පාලන තන්ත්‍රය හා සම්බන්ධව කටයුතු කළ ප්‍රභූ රාජ පෙළපත්වල දේශපාලන කටයුතු ගැන තම මතවාද ඉදිරිපත් කර ඇත. මහාචාර්ය එස්. පරණවිතාන **ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය** පළමු වැනි කාණ්ඩයට "ගම්පොළ හා රයිගම" නමින් හා "අලගක්කෝණාර පෙළපත" නමින් ලිපි දෙකක් සම්පාදනය කරමින්ද මේ යුගය පිළිබඳ කරුණු ගෙනහැර දක්වා ඇත. එසේම ක්‍රි.ව. 1972 **සාහිත්‍ය ගම්පොළ විශේෂ කලාපයට** ලිපියක් ලියමින් අලගක්කෝණාර පෙළපත පිළිබඳ අන්තරාලීන සෙල්ලිපි ඇසුරින් නව මතයක් ඉදිරිපත් කර තිබේ. නමුත් අන්තරාලීන සෙල්ලිපි පිළිබඳ පවතින අවිනිශ්චිතභාවය නිසා එකී තොරතුරු විවාදිතයි. මීට අමතරව **ගම්පොළ ඉතිහාසය** නමින් ගුණාලංකාර වරසම්බෝධි හිමි විසින් රචිත ග්‍රන්ථයේ හා කහටපිටියේ ධීරානන්ද හිමි විසින් රචිත **ගම්පොළ යුගය** නැමැති ග්‍රන්ථයන්හිදී ගම්පොළ යුගයේ ආර්ථික, සාමාජිය, දේශපාලන ඉතිහාසය පිළිබඳව තොරතුරු ගොනුකර ඇත. නමුත් මෙම ප්‍රස්තුතය පිළිබඳ තොරතුරු

[1] **JRAS(CB),Vol. XXXII No 86.**